ශ්‍රී ලංකා ජනාධිපති
இலங்கை சனாதிபதி
President of Sri Lanka

## පණිවුඩය

මිනිස් ශිෂ්ටාචාරයේ අනාගත පැවැත්ම හෝ නැවැත්ම තීන්දු කරන බලවත්ම සාධකය පරිසරය ය යන්න ඉකුත් සියවස අප වෙත ලබා දුන් සමස්ත දැනුම් පද්ධතියේ සංගෘහිත සාරාර්ථයයි. බලය වෙනුවෙන් වූ ලෝක යුද්ධ, පන්ති අරගල, වාර්ගික ගැටුම් ආදී සියලු තේමා පරදා පරිසරය ජගත් සමුළුවල මුලසුනට ප්‍රමුඛත්වය ලබන්නේ එහි ප්‍රතිඵලයක් වශයෙනි.

විද්‍යා පුනරුදයෙන් පසු එළැඹි යුගය සංවර්ධනය ලෙස හඳුනාගත් තරඟකාරී බහු භාණ්ඩික ජීවන මාදිලිය, මිනිසා සහ සොබාදහම අතර පැවැති සහජීවී බැඳීම බලවත් ලෙස පළුදු කළේය. කෘෂිකර්මාන්තය මත පදනම් වූ තිරසර අල්පේච්ඡ ජීවන රටාවක උරුමකරුවන් වූ ශ්‍රී ලාංකිකයන් වන අප ද එම ජීවන මාදිලිය වැළඳගත්තේ විචාරයෙන් තොරවය. අද අප මුහුණ දෙන මැසි මදුරු උවදුරේ සිට ගංවතුර, නායයෑම්, කඳු කඩාවැටීම් දක්වා වූ ස්වාභාවික ව්‍යසනයන් ද බෝ නොවන රෝග ලෙස අප ගොදුරු කරගන්නා සෞඛ්‍ය ගැටලු සියල්ල ද මෙම සංවර්ධන මාදිලිය විසින් අප වෙත කැඳවන ලද උවදුරු බව තර්කානුකූලව සිතා බලා පිළිගැනීමට අපට සිදු වේ.

සංවර්ධනය පිළිබඳ මෙම උභතෝකෝටිකය මගහරිමින් ජගත් පරිසර දිනය සැමරීමට අද අපට නොහැක. "ප්ලාස්ටික් අවභාවිතය මගින් සිදුවන පරිසර දූෂණය පිටු දකිමු" යනුවෙන් මෙවර පරිසර දින තේමාව කරළියට එන්නේ එහි ප්‍රතිඵලයක් වශයෙනි.

පරිසරය පිළිබඳ සෞන්දර්යයාත්මක වර්ණනා නවතා, අපගේ ජීවන මාදිලීන් වෙතින් පරිසරයට එල්ලවන තර්ජන ගැඹුරින් තේරුම් ගනිමින්, පරිසර හිතකාමී ජීවන ආකෘතියක් වෙත ගමන් කිරීමට එම තේමාව අපට බලකර සිටී.

මිනිසා ද සොබාදහමේ එක් නිර්මිතයක් බව වටහා ගනිමින්, සොබාදහමට සමීපව විසීමට අවැසි අවබෝධයෙන් ද කැපවීමෙන් ද යුතුව ජගත් පරිසර දිනය සැමරීමට පෙළගැසෙන සියලු පරිසරකාමීන් සමග මම ද එක්වන අතර, ඒ වෙනුවෙන් සමස්ත පුරවැසියන් වෙත ආරාධනා කරමි.

මෛත්‍රීපාල සිරිසේන

2018 ජුනි මස 05 වන දින

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு
Democratic Socialist Republic of Sri Lanka